ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | කතෝලික ධර්මය - II | පැය දෙකයි |
|---|---|---|

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු වන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

01. 1. ශුද්ධ වූ පාවුලුතුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.
    2. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ දෙක ලියන්න.
    3. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.
    4. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
    5. කිතුණු සභා ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.
    6. ලේඛක දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
    7. ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් අතර වූ සුවිශේෂ කතුවරුන් දෙදෙනා නම් කරන්න.
    8. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ ඇති කරගත් ගිවිසුමේ අඩංගු ප්‍රධාන කරුණු දෙක ලියන්න
    9. මනස්ථාපනයේ ආකාර දෙක නම් කරන්න.
    10. කිතුණු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න.

(ලකුණු 20)

02. 1. මරියතුමියගේ දර්ශනය සිදුවූ අවස්ථාවන් දෙකක් නම් කරන්න.
    2. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 3 ක් ලියන්න.
    3. අද සමාජය තුළ පාපය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන බව දැක්වීමට උදාහරණ පහක් ලියා ඒවා තුරන් කිරීමට ඔබ කරනු ලබන යෝජනා පහක් ලියන්න.

(ලකුණු 10)

03. 1. මුල් කිතුණු සභාව තුළ පැවති ලක්ෂණ 2 ක් ලියන්න.
    2. මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු 3 ක් ලියන්න.
    3. පැවිදි ජීවිතවලට පැමිණෙන පරීක්ෂාවලින් ජය ගැනීමට ඔවුනට අවශ්‍ය ශක්තිය ධෛර්යය ඉල්ලා ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට යාච්ඤාවක් ලියන්න.

(ලකුණු 10)

04. 1. පදවි පූජක පොරොන්දු දෙක නම් කරන්න.
    2. ජේසුස්වහන්සේ පේදුරුතුමාට පැවරූ ප්‍රධාන වගකීම ලියන්න.
    3. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය" යන ශීර්ෂය යටතේ පාසලේ බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න. (වචන 100 ක් ප්‍රමාණවත්ය)

(ලකුණු 10)

05. 1. එක්වරු ශීලයේ පරමාර්ථ දෙකක් ලියන්න
    2. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග 3 ක් නම් කරන්න
    3. දිව්‍ය පූජාවට සහභාගී වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නොලබන ඔබේ මිතුරෙකුට දිව්‍ය සත්ප්‍රසාද භෝජනයේ වැදගත්කම පෙන්වීමට ඉදිරිපත් කරන කරුණු 5 ක් ලියන්න.

(ලකුණු 10)

06. 1. ඊශ්‍රාලයේ පූජා වර්ග බෙදිය හැකි ප්‍රධාන කොටස් 2 නම් කරන්න.
    2. ජනවන්දනාවේ ප්‍රධාන අංග 03 ලියන්න.
    3. වර්තමාන සමාජය තුළ පරිසරය සුරැකීමේ හා වර්ධනය කිරීමේ කිතුණු වගකීම පණ ගැන්වීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

07. 1. මැවීම පිළිබඳ දෙවන කථාවෙන් දෙවියන් වහන්සේ මිනිසාට පවරන ලද වගකීම් 2ක් ලියන්න.
    2. උත්තම පූජක යාච්ඤාවේ ප්‍රධාන කොටස් 03 ලියන්න.

www.edudept.up.gov.lk

3. “දස පනත සර්වකාලීනය” මෙම කියමන කරුණු 5 කින් සනාථ කරන්න.

(ලකුණු 10)

www.edudept.up.gov.lk